සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) සීගිරිය, ඉබ්බන්කටුව, පොළොන්නරුව, කැලණිය, පල්ලවංක, සූකරතිත්ථ, රංචාමඩම, කලාඔය, යෝධ වැව, මාගම, සෙංකඩගල, මිහින්තලේ (ලකුණු 12)

(ii) රෝමය, කොන්ස්තන්තිනෝපල්, පර්සියන් බොක්ක, කැලිකට්, චීනය බුරුමය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - උඩරට ප්‍රදේශ ආශ්‍රිතව මුල්වරට ස්වාධීන රාජධානියක් ගොඩනගන ලද රජතුමා

B - සමන්තපාසාදිකාව නම් කෘතිය රචනා කරන ලද භික්ෂූන් වහන්සේ

C - රතුකැට දිවයින නමින් ශ්‍රී ලංකාව හඳුන්වා ඇති අරාබි ජාතික ඉතිහාසඥයා

D - දේශ ගවේෂණ කටයුතුවලට අනුග්‍රහය දැක්වූ පෘතුගාලයේ කුමාරයා (ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


A

(ii) (1) A රූපයෙන් දක්වෙන නිර්මාණය හඳුන්වන්නේ කුමන නමින් ද?
(2) මෙය කුමන ඓතිහාසික යුගයට අයත් වේද?
(3) මෙය හමුවූයේ කුමන ස්ථානයක කරන ලද කැණීමකින් ද?
(4) කුමන කාර්යයක් සඳහා මෙවා භාවිතා කර තිබේ ද? (ලකුණු 04)


B

(ii) (1) B වලින් දක්වෙන චිත්‍රයේ නිරූපිත රජතුමාගේ නම කුමක් ද?
(2) රාජත්වයට පත්වීමට පෙර මෙතුමා හැඳින්වූයේ කවර නමකින් ද?
(3) මෙතුමා රාජ්‍ය පාලනය සිදුකළ රාජධානිය නම් කරන්න.
(4) මෙම චිත්‍රය අඳින ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 04)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වන දකුණු ඉන්දීය දමිළ ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D දක්වා ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - පුරා විද්‍යාත්මක කැණීම්වලින් ශ්‍රී ලංකාවේ හමුවූ පැරණිතම කාසි හඳුන්වන නම

B - දෙවන පරාක්‍රමබාහු රජු විසින් රචිත සිංහලයේ මහා කාව්‍යය

C - වසභ රාජ්‍ය සමයේ දී නකදිව පාලනය කළ ඇමතිවරයා

D - ක්‍රිස්තු වර්ෂයෙන් දොළොස්වන සියවසේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වන මූලාශ්‍රය

(දේවපතිරාජ , ඉසිගිරි , කහාපණ , පනාකඩුව තඹ සන්නස , මධ්‍යකාලීන රත් කහවණු , පැරකුම්බා සිරිත , වල්ලිපුරම් රන් සන්නස , කව් සිළුමිණ) (ලකුණු 04)

(iii) චිත්‍ර මූර්ති හා පුරාවස්තු රැක ගැනීමේ ඇති වැදගත්කම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඉතිහාසය ගොඩනැගීමේ දී ශිලාලිපි හා නටබුන් වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයන් පිළිබඳ තොරතුරු ලැබෙන පහතරට තෙත් කලාපීය ලෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයින් ආහාරයට ගන්නා ලද ශාකමය ආහාර වර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයින් සතුව පැවති තාක්ෂණික දැනුම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ති රටාවේ වර්ධනය වූ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසුව ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මෙහි පහත නිලධාරීන් හැඳින්වූ නිලනාම වරහන තුළින් තෝරා අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - නාගරික වාස්තු විද්‍යාඥයා

B - භෝජන ශාලා අධිකාරී

C - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී

(බතගු , නගරගුත්තික , කනපෙඩික, නගරවඩ්ඩික, පොතුරුගැනා) (ලකුණු 03)

(ii) රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවා දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි දේශීය හා විදේශීය වෙළෙඳාම දියුණුව පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රේෂ්ඨ පාලකයෙකු වශයෙන් වසභ රජතුමා ඉටුකරන ලද මහඟු කාර්යභාරය උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) අතීතයේ දිගු දුර මැනීමට යොදාගත් මිනුම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - මහවැලි ගඟ හා සම්බන්ධ පැරණි ඇළ මාර්ග දෙකක් ද,

B - අනුරාධපුර නගරයට ජලය සැපයීම සඳහා ඉදිකරන්නට ඇතැයි සැලකෙන වැව් දෙකක් ද. නම් කරන්න. (ලකුණු 04)

(iii) අතීතයේ දී මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පුරාණ කාලයේ සිට මේ රටේ වැසියන්ගේ දේශීය ආහාර පරිභෝජන රටාව නිරෝගිමත් ජීවිතයක් ගත කිරීමට බලපෑ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) A - පළමු නාගරීකරණයට අයත්වන නගර දෙකක් ද,

B - දෙවන නාගරීකරණයට අයත්වන අවසාන අග නගරයද,

පිළිවෙලින් ලියන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සිදුවීම් කුමන රාජධානිය හා සම්බන්ධදැයි A, B, C, D අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය පිහිටුවීම

B - සිංහල සංඝෙ නමින් හඳුන්වන කැරැල්ලක් ඇතිවීම

C - කාලිංගරායර හා චෝඩගංග නම් සෙන්පතීන්ගේ ආක්‍රමණය

D පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම (ලකුණු 04)

(iii) පොළොන්නරු රාජධානිය පරිහානියට පත්වීමට හේතු වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන නාගරීකරණ අවධියේදී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ ඇතිවූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) මහනුවර රාජධානිය ස්වභාවිකව ආරක්ෂා වීමට හේතු වූ ගංගාව සහ දුර්ග මාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) දෙවන රාජසිංහ රජතුමා සිය පාලන සමයේ දී මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය සකස් වී පැවති ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානි සමයෙහි කෘෂිකාර්මික ආර්ථික රටාව සකස් වී තිබූ ආකාරය කරුණු තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ විද්‍යාඥයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) A - පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් චිත්‍ර ශිල්පීන් දෙදෙනෙක් ද,

B - ඔවුන්ගේ ලෝ ප්‍රකට චිත්‍ර නිර්මාණ දෙකක් ද පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04)

(iii) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කර. ඉන් එක් හේතුවක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපයේ ඇති වූ පුනරුදය ලංකාවේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති කිරීමට බලපෑ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ නැගී ආ චින්තන ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස කතෝලික සභාවේ ඇතැම් දුර්වලතා විවේචනය කළ පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් කරුණු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි වරහන තුළින් තෝරා ABCD අනුපිළිවෙළින් නම් කරන්න.

A - මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

B - රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගැනීම

C - බටහිර ඉන්දියා දූපත් සොයා ගැනීම

D - ඩිවිනා කොමිඩියා නම් කාව්‍ය ග්‍රන්ථය රචනා කිරීම

(පෙට්‍රාක්, විලියම් හාවේ, අලගියරි ඩාන්ටේ, ජෝර්ජ් ස්ටීවන්සන්, මයිකල් සර්වේස්, පර්ඩිනන්ඩ් මැගලන්, ජොහැන්නස් ගුටෙන්බර්ග්, ක්‍රිස්ටෝපර් කොලොම්බස්)

(ලකුණු 04)

(iii) පුනරුද සමයේ ප්‍රතිමා කලාව හා ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයන්හි ඇති වූ වෙනස්කම් දෙක බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පුනරුද සමයේ දේශපාලන නවෝදය හා ආර්ථික නවෝදය උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

# පිළිතුරු පත්‍රය
# Marking Scheme

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 2 | (21) 4 | (31) 3 |
| (2) 4 | (12) 3 | (22) 4 | (32) 4 |
| (3) 1 | (13) 3 | (23) 3 | (33) 3 |
| (4) 3 | (14) 1 | (24) 3 | (34) 4 |
| (5) 1 | (15) 1 | (25) 2 | (35) 4 |
| (6) 1 | (16) 3 | (26) 1 | (36) 4 |
| (7) 3 | (17) 1 | (27) 3 | (37) 1 |
| (8) 2 | (18) 1 | (28) 4 | (38) 2 |
| (9) 2 | (19) 2 | (29) 1 | (39) 4 |
| (10) 2 | (20) 2 | (30) 4 | (40) 2 |

## II පත්‍රය

(01) (i) (අ) ලංකා / ලෝක සිතියම් පිළිතුරු පසුපිටේ අමුණා ඇත.

(ආ) A - සේනාසම්මත වික්‍රමබාහු
B - බුද්ධඝෝෂ හිමි
C - අල්බලසුරි
D - හෙන්රි (නාවික හෙන්රි)

(ii) (i) මැටි ඔරු සුසාන
(ii) පූර්ව ඓතිහාසික
(iii) රංචාමඩම
(iv) මිනිස් ඇටසැකිලි ආදාහනය කිරීමට

(iii) (i) දෙවන රාජසිංහ රජතුමා
(ii) මහා අස්ථාන කුමරු
(iii) සෙංකඩගල / මහනුවර
(iv) රොබට් නොක්ස්

## II කොටස

(02) (i) සීලප්පාදිකාරම්, මණිමේඛලෙලෙ, පදිර්රුප්පත්තු

(ii) A - කහාපණ
B - කච්සිළුමිණ
C - ඉසිගිරි
D - පනාකඩුව තඹ සන්නස

(iii) අතීත ජනතාවගේ ඇඳුම් පැළඳුම්, කලා කුසලතාව, ආභරණ භාවිතය, වර්ණ භාවිතය, ආගමික විශ්වාස ආදී තොරතුරු හෙළිකර ගැනීමට, පැරණි ජනතාවගේ විවිධ හැකියා, කුසලතා, පැරණි සංස්කෘතිය, තාක්ෂණය, විශේෂ සබඳතා, ඔවුන්ගේ ජීවන ක්‍රමය ආදී කරුණු පිළිබඳ අවබෝධය ලබා ගැනීමට ...... මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම

(iv) සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් නොවන කරුණු සෙල්ලිපි මගින් අනාවරණය කරගත හැකිවීම (සමාජීය තොරතුරු, ජනාවාස ව්‍යාප්තිය, විහාරවලට ගම්බිම් පිදීම, විහාරාරාම පාලනය, වෙළඳාම හා බදු, රජයේ නීති රීති මහජනතාවට දැනුම් දීමට , ලෙන්ලිපි පිදීම....)

(03) (i) පාහියන්ගල ලෙන, බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන තුනක් ලිවීම

(ii) වල්දෙල්, කැලෑ කෙසෙල්, කිතුල් ඇට මැද, දෝතලු ඇට මැද, ගෝනල, කටුඅල ආදී හතරක් ලිවීම.

(iii) මැටි බඳුන් තාක්ෂණය, සුසාන භාවිතය, යකඩ ලෝහ තාක්ෂණය, ලම්බාකාරව බිත්ති බැඳීම ආදී කරුණු දෙකක් විස්තර කිරීම.

(iv)
- ජනාවාස ව්‍යාප්තිය භෞතික සාධක මත තීරණය වීම
- කුඩා වැව් කේන්ද්‍ර කොට ජනාවාස ව්‍යාප්ත වීම
- වෘත්තීන් මත පදනම් වූ ජනාවාස ව්‍යාප්ත වීම
- පරික්ඛිත්ත ගම් හා අපරික්ඛිත ගම්
- පුර හා නගර ජනාවාස
- කාර්යයන් මත පදනම් වූ ගම්

මින් ලක්ෂණ තුනක් පැහැදිලි කිරීම

(04) (i) A - නගරවඩ්ඩික B - බතගු C - කනපෙඩික

(ii)
- රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම
- රටේ සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම
- ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය
- ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම

(iii) දේශීය වෙළෙඳාම
වෙළෙඳ පොලවල් පැවතීම, වෙළෙඳාමට සම්බන්ධ නීති පැවතීම, බදු අයකර ගැනීම

විදේශ වෙළෙදාම
විදේශීය වෙළෙඳ සංවිධාන, වරාය හා නැව්තොටු පැවතීම, වෙළෙඳ සබඳතා පැවැත්වූ රටවල්, විදේශවලට යවන ලද භාණ්ඩ, විදේශවලින් මෙරටට ගෙන එන ලද භාණ්ඩ, තීරුබදු අයකිරීම
දේශීය හා විදේශීය වෙළෙඳාම යන කරුණු දෙක බැගින් තිබිය යුතු ය.

(iv)
- නව රාජවංශයක් ඇරඹීම
- මධ්‍යගත පාලනය
- මහවැව් ඉදිකිරීම, උමං ජල මාර්ග
- බදු අය කිරීම ක්‍රමවත් කිරීම
- වෙහෙර විහාර තැනවීම හා ප්‍රතිසංස්කරණය

(උදාහරණ තුනක් සහිතව විස්තර කිරීම)

(05) (i) ගව්ව, යොදුන, උසබ

(ii) A - මිනිපේ ඇළ / ඇළහැර ඇළ / අංගමැඩිල්ල ඇළ
B - තිසා වැව, නුවර වැව, බසවක්කුලම (අභය) වැව

(iii) - දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වීම
- පුරා විද්‍යාත්මක තොරතුරු
- වෙදපොත් / වෙදගම් / මහවෙදනා / වෙජ්ජශාලා
(කරුණු දෙකක් විස්තර කිරීම)

(iv) - ධාන්‍ය වර්ග අල බතල, එළවලු , පලාවර්ග අනුභව කිරීම
- එළවළු පිසීමේ ක්‍රම (ආනම , ඇඹුල, නියඬලාව)
- කුළුබඩු භාවිතා කළ බව (කටුක භාණ්ඩ)
- කරපිංචා
- තෙල් භාවිතය (දුන්තෙල් , ගිතෙල්)
- කිරි ආහාර (දීකිරි)
- කැඳ වර්ග ( යවාගු, හෙවත් උළු කැඳ, ඇඹුල් කැඳ)
උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න.

(06) (i) A - අනුරාධපුරය , පොළොන්නරුව , මාගම, සීගිරිය
B - කෝට්ටේ

(ii) A - ගම්පොළ C - දඹදෙණිය
B - කෝට්ටේ D - කුරුණෑගල

(iii) - දුර්වල පාලකයන් බලයට පත්වීම
- කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය
- ආර්ථික පරිහානිය
- කාලිංග මාඝගේ ආක්‍රමණ මීත් කරුණු දෙකක් විස්තර කිරීම

(iv) - කෘෂිකාර්මික කටයුතු සඳහා අහස්දිය යොදාගැනීම
- වාණිජ ආර්ථික රටාවකට හුරුවීම
- විදේශ රටවල් සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීම
- කුරුඳු ප්‍රධාන අපනයන බෝගය වීම
- අපනයන බෝග ලෙස වෙනත් ද්‍රව්‍ය ගම්මිරිස්, එනසාල්. කරාබුනැටි, සදික්කා, පුවක්, මුතු මැණික්, ඇතුන් හා ඇත්දළ
- රජුගේ වෙළෙඳ ඒකාධිකාරය

(07) (i) ගංගාව - මහවැලි ගඟ
දුර්ග මාර්ග - බලන, හුන්නස්ගිරිය, ගලගෙදර, බලකඩුව, ගිනිගත්හේන

(ii) - පෘතුගීසීන්ගේ උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම
- පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම
- උඩරට රදල ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම
- ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.

(iii) - පරිපාලන තන්ත්‍රයේ ඉහළම පුද්ගලයා රජතුමා ය.
- සභායට අදිකාරම්වරු දෙදෙනෙක් සිටීම
- පරිපාලන කටයුතු අංශ කිහිපයකට බෙදා තිබීම
- රාජ්‍යයේ වැදගත් කටයුතු සාකච්ඡා කිරීමට රාජසභාව පැවතීම
- අදිකාරම්වරු, දිසාවේවරු, මහලේකම්, බද්දෙ ලේකම්ලා මෙම සභාවට සහභාගී වීම
- මහ වාසල සේවය, රජුගේ ඍජු පාලනය යටතේ පැවතීම
- රටවසම, මහබද්ද, විහාර හා දේවාලගම් පරිපාලන කටයුතු
ආදී කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කිරීම

(iv) - පරිභෝජනය පදනම් කරගත් ස්වයං පෝෂිත කෘෂිකාමික ආර්ථිකයක් වීම
- වී ගොවිතැන් කළ හැකි ප්‍රදේශ සීමිත වීම හා හේල්මලු වී ගොවිතැන
- වැඩි ඉඩම් ප්‍රමාණයක හේන් ගොවිතැන
- කුරක්කන්, අමු, මෙනේරි, ඉරිඟු වැනි ධාන්‍ය වර්ග හා අල බතල වගා කිරීම
- ගෙවතු ආශ්‍රිතව කොස්, දෙල්, ගම්මිරිස්, සාදික්කා, කරදමුංගු, පුවක්, එලවලු, පලතුරු වගා කිරීම
- කිරි ලබා ගැනීම සඳහා සත්ව පාලන කටයුතු කරුණු තුනක් සහිතව විස්තර කිරීම

## III කොටස

(08) (i) නිකලස් කොපර්නිකස්, ජොහැන්නස් කෙප්ලර්, ගැලිලියෝ ගැලිලි, අයිසෙක් නිව්ටන්
මින් තිදෙනෙක් නම් කිරීම

(ii) A - ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජිලෝ, රෆායෙල්
චිත්‍ර ශිල්පීන් දෙදෙනෙකු නම් කිරීම
B - ඉහත චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර නිර්මාණ දෙකක් පිළිවෙලින් නම් කර තිබීමට

(iii) - කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම
- වෙළෙඳාම දියුණුවීම හා නව ධනවතුන් බිහිවීම
- බුද්ධි ප්‍රබෝධය හේතු තුනක් සඳහන් කිරීමට ලකුණු තුනයි
මින් එක් කරුණක් විස්තර කිරීමට ලකුණු දෙකයි.

(iv) - පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
- නව නිලධාරින් පන්තියක් සහ නව පරිපාලන ආයතන
- රෝම ලන්දේසි නීතිය හා නව අධිකරණ පද්ධතියක්
- ආනයන අපනයන ආර්ථිකයක් සමඟ වෙළෙඳ නගර යුරෝපය සමඟ ඍජු වෙළෙඳ සබඳතා දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයේ ඇතිවූ මෙවැනි වෙනස්කම් උදාහරණ තුනක් සහිතව පැහැදිලි කිරීම
උදාහරණ තුනක් සහිතව පැහැදිලි කළ යුතුය.

(09) (i) මාටින් ලූතර්, ජෝන් වයික්ලිප්, ජෝන්හස්, ඉරාස්මස්.... මින් තිදෙනෙකු නම් කිරීම

(ii) A - ජොහැන්නස් ගුටෙන්බර්ග්
B - විලියම් හාවේ
C - ක්‍රිස්ටෝපර් කොළොම්බස්
D - අලගියරි ඩාන්ටේ

(iii) ප්‍රතිමාකලාව

ලෞකික රස වින්දනයට මුල්තැනක් දීම, ස්වාධීනව තම දක්ෂතා ඉස්මතු කරමින් ප්‍රතිමා නෙළීම, කතෘගේ නමින්ම එළි දැක්වීම, කිරිගරුඬ ප්‍රතිමා නෙළීම ප්‍රචලිත වීම

ගෘහ නිර්මාණ

රෝම ගෘහ නිර්මාණ ශිල්පිය, වටකුරු ආරුක්කු, උස් කුළුණු, අර්ධ ගොලාකාර ශිඛර, සුඛෝපභෝගී මන්දිර තැනීම

ප්‍රතිමා හා ගෘහ නිර්මාණ කලාවේ වෙස්කම් දෙක බැගින් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුයි.

(iv) දේශපාලන නවෝදය

- ජාතික රාජ්‍ය බිහිවීම
- මධ්‍යම පන්තියක් බිහිවීම
- (වෙළෙන්දන්, බැංකු කරුවන්, නැව් හිමියන්, තවලම් හිමියන්)
- වෙළෙඳ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය

ආර්ථික නවෝදය

- ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය පරිහාණියට පත්වීම හා වෙළෙඳාමේ දියුණුව
- ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
- මුදල් භාවිතය වැඩිවීම / නෝට්ටු හා කාසි භාවිතය ප්‍රචලිත වීම
- චෙක්පත්, බැංකු අණකර, මුදල් ණයට දීම බැංකු කටයුතු

දේශපාලන හා ආර්ථික කරුණු තුනක් උදාහරණ සහිතව විස්තර කර තිබිය යුතු ය.

(01) (අ) (i) පිළිතුරු


N
සූකරතිත්ථ
යෝධවැව
පල්ලවවංක
කලා ඔය
සීගිරිය
පොළොන්නරුව
ඉබ්බන්කටුව
සෙංකඩගල
කැලණිය
මිනිහාගල්කන්ද
රංචාමඩම
මාගම

(01) (අ) (ii) පිළිතුරු


N
චීනය
කොන්ස්තන්තිනෝපලය
රෝමය
පර්සියන් බොක්ක
කැලිකට්
යුරෝපය
ஐரோப்பா
Europe
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean